අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/09/96/01/08/02

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2020.07. 30

**චක්‍රලේඛ අංක :- 14/2020**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර අධ්‍යාපන නිලධාරිවරුන්,
සියලු ම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා,
සියලු ම විදුහල්පතිවරුන්,
සියලු ම පෞද්ගලික පාසල් ප්‍රධානීන්,
සියලු ම ජාත්‍යන්තර පාසල් ප්‍රධානීන්,

**"රටක් වටින පොතක්" පොත් 10,000ක් ලිවීමේ ජාතික ව්‍යාපෘතිය සංශෝධනයයි**

2020.04.23 දිනැති අංක 14/2020 යටතේ මා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව ක්‍රියාත්මක වූ "රටක් වටින පොතක් " ලිවීමේ ජාතික වැඩසටහන 2020.07.02 දින මාගේ අංක ED/09/96/01/08/02 දරණ ලිපිය අනුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත පවරා ඇත.

14/2020 එකී චක්‍රලේඛය උපදෙස් පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරෙන බව ඔබ වෙත දන්වා සිටින අතර ඒ අනුව ඉදිරි කටයුතු කළ යුතු බව මෙයින් දන්වමි.

**"රටක් වටින පොතක්" පොත් 10,000ක් ලිවීමේ ජාතික වැඩසටහනට, අදාළ සියලුම සිසු නිර්මාණ පාසල් වෙත භාර ගැනීමේ අවසාන දිනය 2020 ජුලි මස 30 වන දින දක්වා දීර්ඝ කර ඇත.**

පාසල් වෙත භාර දෙනු ලබන කෘති ඉහත දිනයෙන් පසු පිළිවෙලින් කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාරදිය යුතු වේ. ඉන් අනතුරුව ඒ ඒ පළාත්වල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් සියලුම ළමා කෘති ජා.පු.හා.ප්‍ර.සේ.ම. වෙත භාර දිය යුතු වේ.

| | |
|---|---|
| **පාසල මගින් කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය වෙත භාරදිය යුතු අවසන් දිනය** | **: 2020 අගෝස්තු 05** |
| **කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් කලාප කාර්යාලය වෙත භාරදිය යුතු අවසන් දිනය** | **: 2020 අගෝස්තු 12** |
| **කාලාප කාර්යාලය මගින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතු අවසන් දිනය** | **: 2020 අගෝස්තු 20** |

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ජා.පු.හා ප්‍ර.සේ.ම. වෙත භාරදිය යුතු දිනය පළාත් මට්ටමින් පහත දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| බස්නාහිර පළාත : | 2020 අගෝස්තු 26 | ඌව පළාත : | 2020 සැප්තැම්බර් 03 |
| මධ්‍යම පළාත : | 2020 අගෝස්තු 27 | නැගෙනහිර පළාත : | 2020 සැප්තැම්බර් 04 |
| උතුරු පළාත : | 2020 අගෝස්තු 28 | සබරගමු පළාත : | 2020 සැප්තැම්බර් 08 |
| දකුණු පළාත : | 2020 අගෝස්තු 31 | වයඹ පළාත : | 2020 සැප්තැම්බර් 09 |
| උතුරු මැද පළාත : | 2020 සැප්තැම්බර් 02 | | |

ඒ ඒ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් සියලුම ළමා කෘති ළමුන්ගේ තොරතුරු (ළමයාගේ නම, පොතේ නම, පාසලේ නම හා ලිපිනය, ඉගෙන ගන්නා ශ්‍රේණිය) ඇතුළත් ලැයිස්තු මගින් ජා.පු.හා.ප්‍ර.සේ.ම. වෙත භාර දිය යුතුය.

අදාළ පාසල මගින් සමීක්ෂණය කර භාර දෙන ළමා කෘති තවදුරටත් සමීක්ෂණය කිරීම අවශ්‍ය නොවන අතර සමස්තය ජා.පු.හා.ප්‍ර.සේ.ම. මගින් සමීක්ෂණයට ලක් කරනු ලැබේ.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා www.natlib.lk ජා.පු.හා ප්‍ර.සේ.ම වෙබ් අඩවිය තුළින් මෙන් ම යම් ගැටලුවක් වේ නම් දුරකථන අංක : 0112 698847/0113610773 මගින් ජා.පු.හා.ප්‍ර.සේ.ම. පුස්තකාල ප්‍රවර්ධන ප්‍රමිතිකරණ හා ප්‍රකාශන අධ්‍යක්ෂ ඇමතිය හැකි ය.

එන්.එච්.එම්.චිත්‍රානන්ද
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.